මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல 02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

LAE\2023\44

2023.03.10

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා නාමයෝජනා භාර දී, අපේක්ෂකත්වයේ සිටින රජයේ නිලධරයින් සඳහා සහනයක් ලබා දීම.**

2023 මාර්තු මස 09 වන දින පැවැත්වීමට සැලසුම් කරන ලද පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2023 සඳහා රජයේ නිලධරයින් 3000 ක් පමණ නාමයෝජනා භාර දී ඇති අතර ඔවුන් ඒ සඳහා එම සේවා ස්ථාන මගින් වැටුප් රහිත නිවාඩු අනුමත කර ඇත. රාජ්‍ය සේවකයින් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් නියෝජනය කරමින් නාමයොජනා භාර දුන් පසු අදාල ඡන්ද විමසීම පවත්වා ප්‍රතිඵල නිකුත් කරන තෙක් වැටුප් රහිත නිවාඩු ලබා ගත යුතු වේ.

එසේ වුව ද, 2023 මාර්තු මස 09 වන දින පැවැත්වීමට සැලසුම් කර තිබූ මෙවර පළාත් පාලන ආයතන ඡන්ද විමසීම,නොවැළැක්විය හා අනපේක්ෂිත හේතු මත මේ වන විට 2023 අප්‍රේල් මස 25 දින දක්වා කල් තැබීමට සිදු වී ඇත. වත්මන් ආර්ථික තත්ත්වය යටතේ එසේ දිගු කාලසීමාවක් සඳහා වැටුප් රහිත නිවාඩු ලබාගැනීම මගින් එම නිලධරයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල ආර්ථික ස්ථාවරත්වය පවත්වා ගැනීම දැඩි සේ දුෂ්කර වී ඇති බැවින්, නාමයෝජනා භාර දුන් රාජ්‍ය සේවකයින් සඳහා යම් සහනයක් ලබා දීමට කටයුතු කරන ලෙසට නිරන්තරයෙන් මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉල්ලීම් ඉදිරිපත් වෙමින් පවතී. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 102 ව්‍යවස්ථාව ප්‍රකාරව, ඡන්ද විමසීම අවසන් වන තෙක් ඔවුන් නැවත සේවයේ පිහිටුවීමේ නීතිමය හැකියාවක් ද නොපවතී.

ඒ අනුව, 2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම වෙනුවෙන් නාමයෝජනා භාර දී, අපේක්ෂකත්වයේ සිටින රාජ්‍ය සේවකයින් සඳහා, 2023.03.09 දින සිට එම ඡන්ද විමසීම ප්‍රමාද වන කාලය තුළ අදාල නිලධරයාගේ මූලික වැටුප පමණක් ගෙවීම් කිරීම සුදුසු බව මැතිවරණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කර, එකී නිර්දේශය සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල තීරණයක් ලබා ගැනීමට කටයුතු කරන ලෙස දන්වා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත දැනුම් දී ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්